**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය**

**இலங்கை ஏற்றுமதி அபிவிருத்தி சபை**

SRI LANKA EXPORT DEVELOPMENT BOARD

**වෙළඳ අමාත්‍යාංශය**

# ඇබෑර්තු

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB), අපනයන ප්‍රවර්ධනය සහ සංවර්ධනය කිරීම සඳහා වූ ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය වේ. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයෙහි උපාය මාර්ග සැලැස්මේ සඳහන්ව ඇති අපනයන ඉලක්ක ළඟා කර ගැනීම සඳහා දායකත්වය සැපයිය හැකි සනාථ වූ හැකියාවන් හා වෘත්තිය නිපුණතාවයෙන් හෙබි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් පහත සඳහන් තනතුර පිරවීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**කළමනාකරණ සහකාර තනතුර (තාක්ෂණික නොවන) (MA 1 – 1)**

**රැකියා විස්තරය**

- අදාළ අංශය මගින් කරගෙන යනු ලබන ක්‍රියාකාරකම්වලට අයත් සියලුම ලිපි ලේඛන හා ලේකම් වැඩ කටයුතුවල නියැලීම.
- ලිපිගොනු නඩත්තු කිරීම.
- වාර්ෂික සහ කාර්තුවලට අදාළ තොරතුරු යාවත්කාලීන කිරීම සහ අධීක්ෂණය කිරීම.

**සුදුසුකම්**

අ.පො.ස. (සා.පෙ.) විභාගයේ දී සිංහල / දෙමළ, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය / අංක ගණිතය ඇතුළුව විෂයයන් හතරක් (04) සඳහා සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් හය (06) කින් සමත් වී තිබීම.

සහ

අ.පො.ස (උ.පෙ.) විභාගයේදී අවම වශයෙන් විෂයයන් තුන (03) කින් (පොදු ප්‍රශ්න පත්‍රය හැර) සමත් වී තිබීම.

**අතිරේක සුදුසුකම්**

- යතුරු ලියන වේගය : විනාඩියකට වචන 30 – 40 (ඉංග්‍රීසි / සිංහල)
- ඉංග්‍රීසි භාෂාවෙන් වැඩ කිරීමට ඇති හැකියාව
- දුරකථන පද්ධතිය / PABX ක්‍රියාකිරීමේ හැකියාව
- පරිගණක දැනුම සහ අදාළ ක්ෂේත්‍රයේ පළපුරුද්ද

**වැටුප් පරිමාණය :**

රු. 27,910/- 10 X 300 – 7 X 350 – 4 X 495 – 20 X 660 - රු. 48,540/- (මාසික) සහ රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.

**තෝරා ගැනීමේ ක්‍රමය :** ලිඛිත තරඟ විභාගයක සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත

**වයස :** අවුරුදු 18 ට අඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. මෙම උපරිම වයස් සීමාව රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනවල අයදුම්කරුවන්ට සහ අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

**වෙනත් ප්‍රතිලාභ :**

- ❖ අපනයන සංවර්ධන මණ්ඩලයීය වෛද්‍යාධාර යෝජනා ක්‍රමයක්.
- ❖ ප්‍රවාහන පහසුකම්
- ❖ ලබා නොගත් වෛද්‍ය නිවාඩු මූල්‍යකරණය සහ වාර්ෂික ප්‍රසාද දීමනා
- ❖ රජයේ අනුමත සහන පොලී ප්‍රමාණයන් යටතේ නිවාස ණය හා ආපදා ණය
- ❖ සේවක අර්ථසාධක අරමුදල – සේවකයාගෙන් 10%, ආයතනයෙන් 15% සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල – ආයතනයෙන් 3%

**අයදුම් කිරීමේ පිළිවෙළ :**

අදාළ අයදුම්පත්‍රය අපනයන සංවර්ධන මණ්ඩලයේ 05 වන මහලේ පිහිටි මානව සම්පත් කළමනාකරණ අංශයෙන් හෝ www.srilankabusiness.com වෙබ් අඩවියෙන් ("Announcements" කාණ්ඩය යටතේ) ලබා ගත හැක.ලිපි කවරයේ ඉහළ වම් පස කෙළවරේ තනතුරු නාමය සඳහන් කරමින් සම්පූර්ණ ජීව දත්ත සඳහන් නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් සහ අදාළ සියලුම සහතික පත්‍රවල පිටපත් අපනයන සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත **2021.03.05** වැනි දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. **නියමිත අයදුම්පත්‍රය (EDB අයදුම්පත්‍රය) හා අදාළ සහතිකවල පිටපත් සමඟ ඉදිරිපත් නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

රාජ්‍ය අංශයේ සේවකයන්ගේ අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුයි. එම අයදුම්පතේ අමතර පිටපතක් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර මණ්ඩලය වෙත එවන මෙන් අයදුම්කරුවන්ට උපදෙස් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ ජනරාල්**

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය,**

**NDB - EDB ටවර්, අංක 42, නවම් මාවත, කොළඹ 02.**

**දුර : 011 - 2300700, ෆැක්ස් : 011 - 2300715**

**වෙබ් : www.srilankabusiness.com**